---

මහව ප්‍රාදේශීය සභාව

කුරුණෑගල දිස්ත්‍රික්කය

---

1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 07 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 ජූලි 09 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 අගෝස්තු 30 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 <u>මතය</u>

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතු කොටගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති මහව ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි.

1.3 <u>මූල්‍ය ප්‍රකාශන පිළබඳ අදහස් දැක්වීම</u>

1.3.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

වටිනාකම රු.4,651,562 ක් වූ ස්ථාවර තැන්පතු 4 ක් සඳහා ලැබිය යුතු රු.503,739 ක පොලී මුදල් වර්ෂයේ ආදායම් ලෙස හඳුනාගෙන ගිණුම්ගත නොකිරීම මත වර්ෂයේ පොලී ආදායම හා වර්ෂය අවසානයට ස්ථාවර තැන්පතු වටිනාකම රු.503,739 ක් අඩුවෙන් දක්වා තිබුණි.

1.3.2 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.22,894,861 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. <u>මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය</u>

2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.1,373,055 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,254,379 ක් විය.

2.2 <u>මූල්‍ය පාලනය</u>

පහත සඳහන් මූල්‍ය පාලන අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). ණය හිමියන් (වෙනත්) තුල දේශීය ණය සංවර්ධන අරමුදලට ගෙවිය යුතු රු.1,620,818 ක පොලී ශේෂයක්ද, රජයේ විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු රු.3,670,147 ක නිරවුල් නොකල ශේෂයක්ද පැවතුණි. එමෙන්ම විවිධ ණයහිමි ශේෂය තුල පැවති රු.2,168,000 ක් නිශ්චිතව ණය හිමියන් බවට පත් නොවූ අයවැය ලේඛන අනුව කර්මාන්ත සඳහා මන්ත්‍රී යෝජනා ලෙස වෙන්කළ ප්‍රමාණයකින් සමන්විත වුණි.

(ආ). රු.3,856,876 ක කර්මාන්ත තැන්පතු තුල වූ 2009 සංචාරක අමාත්‍යාංශය විසින් මහව පොදු පහසුකම් මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා ලැබී තිබූ රු.2,296,253 ක රු.1,560,623 ක අතරැඳවුම් මුදල් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම නිරවුල් කර නොතිබුණි.

## 2.3 <u>ආදායම් පරිපාලනය</u>

### 2.3.1 <u>ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්</u>

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තු ගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. 000 | රු. 000 | රු. 000 |
| (i) | වරිපනම් හා බදු | 2,070 | 1,191 | 1,818 |
| (ii) | බදුකුලී | 7,000 | 6,206 | 298 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 426 | 217 | - |
| (iv) | වෙනත් ආදායම් | 880 | 989 | 128 |

### 2.3.2 <u>වරිපනම් බදු</u>

සමාලෝචිත වර්ෂය අවසානයට වරිපනම් බදු හිඟය රු.1,817,617 ක් විය. මෙම හිඟය තුල වර්ෂයකට වඩා පැරණි රු.1,078,885 ක අගයක් පැවති අතර, හිඟබදු අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තිය හා 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ රීති අංක 31-42 විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

### 2.3.3 <u>බදුකුලී</u>

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). සභාව සතු අවම ලංසුව රු.681,002 ක් වූ දේපල 8 ක් සමාලෝචිත වර්ෂයට අදාලව බදුදී නොතිබුණි. එමෙන්ම දීර්ඝ කාලීන බදුදීම් යටතේ 1991 සිට 1995 කාලයට අදාලව රු.280,600 ක

හා සමාලෝචිත වර්ෂයට අදාල රු.63,882 ක හිඟ බදු මුදල් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අයකරගෙන නොතිබුණි.

(ආ). මහව පොදු වෙළඳපල අංක 06 කඩ කාමරයට අදාලව 2002 වර්ෂයේ සිට පවතින රු.30,099 ක හිඟ බදු කුලී මුදලක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ). සභාවට අයත් මාර්ග තලනය පෞද්ගලික සමාගමක් වෙත කුලී පදනම මත ලබාදී තිබූ අතර එකී සමාගමෙන් සමාලෝචිත වර්ෂය අවසන් වනවිට රු.1,092,179 ක් අයවීමට තිබුණි. මෙකී හිඟ මුදල් සම්බන්ධව අධි ගාස්තු හෝ දඩ පිළිබඳ විධිවිධාන අදාල ගිවිසුම් වලට ඇතුලත්ව නොතිබීමෙන් ප්‍රමාද ගාස්තුවක් අයකර ගැනිමට තිබූ අවස්ථා ගිලිහී තිබුණි. එමෙන්ම සභාව සතු බැකෝ යන්ත්‍රය පැයකට රු.1,320 ක් අයකිරීමේ පදනම මත මාර්ග සංවර්ධන අධිකාරයේ සේවය සඳහා යොදවා තිබූ අතර, සමාලෝචිත වර්ෂයට අදාලව රු.1,246,398 ක මුදලක් අයවිය යුතුව තිබුණි.

2.3.4 <u>ව්‍යාපාර බදු හා වෙළඳ බලපත්‍ර ගාස්තු</u>

සභාව විසින් ව්‍යාපාර බදු හා වෙළඳ බලපත්‍ර බිල් කිරීම් වලට අදාලව 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ රීති 59 හා 67 හි දක්වා ඇති පරිදි වූ සමීක්ෂණ පවත්වා නොතිබුණි.

2.3.5 <u>දුරකථන සම්ප්‍රේෂණ කුළුණු සඳහා පෙරසැරි ගාස්තු</u>

සභා බල ප්‍රදේශය තුල සමාලෝචිත වර්ෂය අවසානය වන විට දුරකථන සම්ප්‍රේෂණ කුළුණු 07 ක් ස්ථාපිත කර ඇති බවට හඳුනාගෙන තිබූ අතර සමාලෝචිත වර්ෂය තුල කුළුණු දෙකක් සඳහා පමණක් රු.451,360 ක පෙරසැරි ගාස්තු අයකර තිබුණි. මෙකී කුළුණු වෙනුවෙන් වෙළඳ බලපත්‍ර හෝ ව්‍යාපාර බද අයකර නොතිබුණි.

2.3.6 <u>වාහන නවතා තැබීමේ ගාස්තු</u>

සභා බල ප්‍රදේශය තුල වාහන නැවැත්වීමට අදාල අතුරු ව්‍යවස්ථාවක් පැවතියද, ත්‍රීරෝද රථ නැවැත්වීමට අදාලව වාර්ෂිකව හෝ කාලානුරූපීව සමීක්ෂණයක් කර සභා බල ප්‍රදේශය තුල පවතින නැවතුම් ස්ථාන විධිමත් කිරීමක් හෝ ත්‍රීරෝද රථ ලියාපදිංචියක් සිදුව නොතිබුණි. අදාල අතුරු ව්‍යවස්ථාව අනුව එක් ත්‍රීරෝද රථයකින් මාසිකව රු.50 ක ගාස්තුවක් අයකරන බව සඳහන් වුවද, 2011 වර්ෂය වන විට හඳුනාගෙන පැවති ත්‍රීරෝද රථ නැවතුම් ස්ථාන 33 හි ලියාපදිංචි ත්‍රීරෝද රථ වලින්ද එපරිදි මුදල් අයකර ඇති බවක් හඳුනාගත නොහැකි විය.

2.4 <u>නිශ්ක්‍රීය භෞතික සම්පත්</u>

වර්ෂ ගණනාවක සිට පැවත එන රු.114,202 ක් වටිනා නළ ළිං උපකරණ හා රු.34,527 ක් වටිනා ජල උපකරණ ප්‍රයෝජනවත් කාර්යයට යෙදවීමට කටයුතු කර නොතිබුණි.

2.5 <u>මතභේදයට තුඩුදෙන ගනුදෙනු</u>

(අ). සභාවට අයත් මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය කුලියට දීමට අදාල 2011 ජූලි 06 දිනැති ගිවිසුමෙහි 09 වගන්තියේ සඳහන් පරිදි "යන්ත්‍රය සේවයේ යොදවා ගැනීම වෙනුවෙන් මාසික කුලී ගාස්තුව වශයෙන් පැයකට රු. 2576 ක් දිනකට පැය 06 බැගින් දින 25 ක් ලෙස ගණනය කරනු ලබන රු.386,400 ක කුලි ගාස්තුවක් තැන්පතුවක් වශයෙන් පළමු පක්ෂය වෙත ගෙවීමට දෙවන පක්ෂය එකඟ වේ" යන්න දක්වා තිබුණද සභාව විසින් කුලී මුදල් ගණනය කිරීමේදී එපරිදි ගණනය නොකර තත්‍ය ලෙස භාවිත කල මීටර් පැය පදනමට ගාස්තු ගණනය කර අයකර තිබුණි. ඒ හේතුවෙන් 2011 ජූලි සිට 2012 අප්‍රේල් කාලයට අදාලව රු.1,791,105 ක් අඩුවෙන් ගාස්තු ගණනය කර තිබුණි.

(ආ). සභාවට අයත් මාර්ග තලනය කුලියට දීමට අදාල 2011 ජූලි 06 දිනැති ගිවිසුමෙහි '9' වගන්තිය ප්‍රකාරව, "යන්ත්‍රය සේවයේ යොදවා ගැනීම වෙනුවෙන් මාසික කුලී ගාස්තුව වශයෙන් පැයකට රු.1240 ක් හා දිනකට පැය 06 බැගින් දින 25 ක් ලෙස ගණනය කරනු ලබන රු.186,899 ක කුලි ගාස්තුවක් තැන්පතුවක් වශයෙන් පළමු පක්ෂය වෙත ගෙවීමට දෙවන පක්ෂය එකඟ වේ" යන්න දක්වා තිබුණද සභාව විසින් කුලී මුදල් ගණනය කිරීමේදී එපරිදි ගණනය නොකර තත්‍ය ලෙස භාවිත කල මීටර් පැය පදනමට ගාස්තු ගණනය කර අයකර තිබුණි. ඒ හේතුවෙන් 2011 ජූලි සිට 2012 මැයි කාලයට අදාලව රු.221,742 ක් අඩුවෙන් ගාස්තු ගණනය කර තිබුණි.

2.6 <u>වත්කම් කළමනාකරණය</u>

සභාව සතු රු.102,262,063 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි, යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ, මෝටර් රථ හා කරත්ත හා ලීබඩු හා සවිකිරීම් සමීක්ෂණය කර නොතිබුණි.

2.7 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). සේවා ගාස්තු ආදායම් ලෙස රු.9,456,000 ක් ඇස්තමේන්තු කළද සමාලෝචිත වර්ෂය තුල සත්‍ය වශයෙන් උපයා පැවතියේ ඉන් 51% ක් ලෙස රු.4,860,000 ක් පමණි. ප්‍රාග්ධන වියදම් යටතේ රු.18,100,000 ක වියදමක් දැරීමට ඇස්තමේන්තු කර තිබුණද පරිපූරක හෝ වෙනත් වැය මාරු කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂය තුල රු.52,200,000 ක වියදමක් දරා තිබුණි.

(ආ). පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු දායක මුදල් නිසි පරිදි නොගෙවීම නිසා සමාලෝචිත වර්ෂය අවසානය වන විට එකී අරමුදලට ගෙවිය යුතු ශේෂය රු…3,670,147 ක්ව තිබුණි.

(ඇ) මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය සඳහා දේශිය ණය හා සංවර්ධන අරමුදලින් ලබාගත් ණය නිසි පරිදි නොගෙවීම මත අදාල ණය මුදල් වෙනුවෙන් රු.99,400 ක අමතර පොලී මුදලක් සමාලෝචිත වර්ෂයේදී ගෙවීමට සිදුව තිබුණි.

2.8 <u>ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය</u>

(අ). පිළිසරු ජාතික ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන මත රු.3,982,801 ක පිරිවැයකට ක්‍රියාත්මක කර 2011 නොවැම්බර් වන විට වැඩ අවසන් කළයුතු ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය ඉදිකිරීමට අදාලව 2012 ඔක්තෝබර් 08 දින ක්ෂේත්‍ර පරීක්ෂණ අවස්ථාව වන විට කොම්පෝස්ට් සෑදීමේ යන්ත්‍රය ස්ථාන ගතකර නොතිබූ අතර, ජල හා විදුලිය සැපයුම් ලබාගෙන නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම එහි මෙහෙයුම් කටයුතු සිදුව නොතිබුණි.

(ආ) සභා බල ප්‍රදේශය තුල එකතුවන කසළ බැහැර කිරීම සඳහා හෙක්ටයාර් 0.8 ක පමණ වත්තයාය හේන නැමති ඉඩම් කොටසක් යොදාගෙන තිබූ අතර, එයට සියළු අපද්‍රව්‍ය වර්ගකිරීමකින් තොරව එකට එකතුකර බැහැර කර තිබුණි. එමෙන්ම අදාල පරිශ්‍රය අනාරක්ෂිතව පැවතීම හේතුවෙන් වනසතුන්ගේ පැමිණීම සිදුව තිබුණි.

2.9 <u>කාර්ය සාධනය</u>

සමාලෝචිත වර්ෂයට අදාලව සුභසාධක කාර්යයන් 5 ක් වෙනුවෙන් වෙන්කර තිබූ රු.1,818,125 ක් අදාල කාර්යයට යොදවා නොතිබුණි. එමෙන්ම සතිපොළ සංවර්ධනය සඳහා වෙන්කර තිබූ රු.2,000,000 න් රු.1,826,700 ක් ඉතිරි වී තිබූ අතර නව වීථි පහන් සවිකිරීම සඳහා වෙන්කළ රු.150,000 ක මුදලද වියදම් කර තිබුණි.

3. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). ගිණුම්කරණය

(ආ) මූල්‍ය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ). වත්කම් කළමනාකරණය

(ඉ) කොන්ත්‍රාත් පරිපාලනය